www.agaram.lk

OL/2017/85/S-I, II (NEW)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

Department of Examinations, Sri Lanka

85 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2017 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2017

| | | |
|---|---|---|
| ගෘහ ආර්ථික විද්‍යාව | I, II | පැය තුනයි |
| மனைப் பொருளியல் | I, II | மூன்று மணித்தியாலம் |
| Home Economics | I, II | Three hours |

## ගෘහ ආර්ථික විද්‍යාව I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර** තෝරා ගන්න.

(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**

(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** සරල කාබොහයිඩ්‍රේට් වර්ගයකි,
(1) මෝල්ටෝස්. (2) සෙලියුලෝස්. (3) ගැලැක්ටෝස්. (4) සුක්රෝස්.

**2.** මිනි ප්‍රෝටීන් අඩුම ප්‍රමාණයක් අඩංගුව ඇත්තේ,
(1) දඹලවල ය. (2) මස්වල ය. (3) පරිප්පුවල ය. (4) කිරිවල ය.

**3.** බහු අසන්තෘප්ත මේද අම්ලයකි,
(1) ලෝරික් අම්ලය. (2) ඔලීක් අම්ලය. (3) ලිනොලීක් අම්ලය. (4) බියුටිරික් අම්ලය.

**4.** මාගරින් ග්‍රෑම් 10ක ශක්ති අගය වනුයේ,
(1) කිලෝකැලරි 40කි. (2) කිලෝකැලරි 55කි. (3) කිලෝකැලරි 70කි. (4) කිලෝකැලරි 90කි.

**5.** සත්ත්වමය ආහාරවල අඩංගු විටමින් A හඳුන්වනුයේ,
(1) රෙටිනෝල් ලෙස ය. (2) කෝලිකැල්සිෆෙරෝල් ලෙස ය.
(3) බීටා කැරොටීන් ලෙස ය. (4) ටොකොෆෙරෝල් ලෙස ය.

**6.** විටමින් $B_6$ ලෙස හඳුන්වනුයේ,
(1) නයසීන් ය. (2) පිරිඩොක්සීන් ය. (3) රයිබොෆ්ලේවින් ය. (4) තයමීන් ය.

**7.** නිර්දේශිත පෝෂණ අවශ්‍යතා සටහනෙහි, අවශ්‍යතාව ග්‍රෑම්වලින් දක්වා ඇති පෝෂකය වනුයේ,
(1) ප්‍රෝටීන් ය. (2) යකඩ ය. (3) කැල්සියම් ය. (4) විටමින් C ය.

**8.** ආහාර පිරමීඩයෙහි පහළ සිට ඉහළට පිළිවෙලින් අඩංගු කර ඇති ආහාර ද්‍රව්‍ය කිහිපයකි,
(1) ධාන්‍ය නිෂ්පාදිත, කිරි නිෂ්පාදිත, මාෂබෝග හා සීනි.
(2) අල වර්ග, කිරි, මාළු හා මේද.
(3) ධාන්‍ය, එළවළු, මස් හා සීනි.
(4) අල වර්ග, බිත්තර, පලතුරු හා මේද.

**9.** 'A' නමැති ආහාර ද්‍රව්‍යය හා සම්බන්ධ කරුණු කිහිපයක් පහත දැක්වේ.
- ප්‍රරෝහණය කළ හැකි ය.
- ප්‍රෝටීන් ප්‍රභවයකි.
- ලෙසිතීන් අඩංගු ය.
- මාෂබෝගයකි.

'A' විය හැක්කේ,
(1) ඉරිඟු ය. (2) මුංඇට ය. (3) තිරිඟු ය. (4) රටකජු ය.

[දෙවැනි පිටුව බලන්න.

agaram.lk
Agaram.lk - Keep your dreams alive !
Agaram.lk - Keep your dreams alive !

www.agaram.lk



**10.** මස් හා කිරිවල අඩංගු ප්‍රෝටීන වනුයේ, පිළිවෙළින්
(1) මයොසින් හා කේසින් ය. (2) ග්ලූටන් හා ඉලාස්ටින් ය.
(3) ග්ලොබියුලින් හා ඇල්බියුමින් ය. (4) ඇවිඩින් හා කොලැජන් ය.

**11.** ඝන පිටිමෝලියකින් සාදන ලද ආහාරයකි,
(1) කොකිස්. (2) කේක්. (3) පැටිස්. (4) බනිස්.

**12.** පහත දක්වා ඇත්තේ උදේ ආහාර වේලකි.
- ඉඳිආප්ප
- අල ව්‍යංජනය
- පොල්සම්බල
- කිරි වීදුරුවක්

මෙහි අඩංගු වන පෝෂක කිහිපයකි,
(1) සම්පූර්ණ ප්‍රෝටීන්, කාබොහයිඩ්‍රේට් හා කැල්සියම්. (2) කාබොහයිඩ්‍රේට්, මේද හා විටමින් C.
(3) සම්පූර්ණ ප්‍රෝටීන්, යකඩ හා මේද. (4) කාබොහයිඩ්‍රේට්, යකඩ හා විටමින් E.

**13.** මන්ද පෝෂණයෙහි දී පෙන්නුම් කරන 'ක්ෂයවීම' නමැති තත්ත්වය ලෙස හඳුන්වනුයේ,
(1) වයසට සරිලන උස නොමැති බව ය.
(2) උසට සරිලන බර නොමැති බව ය.
(3) වයසට සරිලන බර නොමැති බව ය.
(4) වයසට සරිලන උස හා බර නොමැති බව ය.

**14.** නිරක්තයෙහි රෝග ලක්ෂණයකි,
(1) ඉදිමාව. (2) පාචනය. (3) විඩාව. (4) මලබද්ධය.

**15.** පහත දැක්වෙන අගයයන්ගෙන් අධිබර තත්ත්වය පෙන්නුම් කරන ශරීර ස්කන්ධ දර්ශක අගය වනුයේ,
(1) 20 ය. (2) 23 ය. (3) 27 ය. (4) 32 ය.

**16.** ප්‍රෝටීන් ජීර්ණය කරන එන්සයිමයකි,
(1) ඇමයිලේස්. (2) පෙප්ටිඩේස්. (3) ලයිපේස්. (4) සුක්රේස්.

**17.** pH අගය අඩුවීම මගින් පරිරක්ෂණය වන ආහාරය මින් කුමක් ද?
(1) අඹ ජෑම් (2) කරවල (3) අලවොෆි (4) මැලේ අච්චාරු

**18.** පහත සඳහන් කරුණු අතුරෙන් ස්ත්‍රී ප්‍රජනක පද්ධතිය හා සම්බන්ධ නිවැරදි කරුණ කුමක් ද?
(1) එක් මසක් තුළ, ඩිම්බ කෝෂ දෙක ම පරිණත ඩිම්බය බැගින් මුදා හරියි
(2) ආර්තවය ආරම්භ වනුයේ ඩිම්බ මෝචනය හා සමග ම ය
(3) ෆැලෝපීය නාලවල කෘත්‍යය වනුයේ පරිණත ඩිම්බ රඳවා තබා ගැනීමයි
(4) කලලය ගර්භාෂය තුළ අධිරෝපණය වීම සිදු වේ

**19.** ගර්භිණී මවකට ලබා දිය යුතු එන්නතකි,
(1) පිටගැස්ම. (2) කම්මුල්ගාය. (3) හෙපටයිටිස් B. (4) රුබෙල්ලා.

**20.** ගර්භිණී අවධියේ දී ඇතිවිය හැකි සංකූලතාවකි,
(1) සමහර ආහාර කෙරෙහි අප්‍රියතාව (2) පාද සුළු වශයෙන් ඉදිමීම
(3) සුළු රුධිර වහනයන් ඇතිවීම (4) නිතර නිතර මූත්‍ර බැහැර කිරීම

**21.** නවජ දරුවකු තුළ දැකිය හැකි ලක්ෂණයක් **නොවනුයේ,**
(1) දවසේ වැඩි කාලයක් නිදා ගැනීම ය.
(2) ආලෝකය දෙසට හිස හැරවීම ය.
(3) කඳ හා ගාත්‍රාවලට සාපේක්ෂව හිස විශාලව තිබීම ය.
(4) ශබ්දවලට තිගැස්සීම ය.

**22.** ජැපනීස් එන්සෙෆලයිටිස් (JE) එන්නත ළදරුවාට දෙනු ලබන්නේ වයස මාස
(1) 4 සම්පූර්ණ වූ විට ය. (2) 6 සම්පූර්ණ වූ විට ය. (3) 9 සම්පූර්ණ වූ විට ය. (4) 12 සම්පූර්ණ වූ විට ය.

[තුන්වැනි පිටුව බලන්න.

Agaram.lk - Keep your dreams alive !
Agaram.lk - Keep your dreams alive !
agaram.lk

www.agaram.lk



**23.** වයස මාස 5ක පමණ ළදරුවකු සාමාන්‍යයෙන්,
(1) උදව් නැතිව වාඩි වේ. (2) හිස සෘජුව තබා ගනියි.
(3) ප්‍රතිචාරයක් ලෙස සිනාසීම ආරම්භ කරයි. (4) ක්‍රීඩා භාණ්ඩ අතින් අතට මාරු කරයි.

**24.** පළමුවසර තුළ දී දරුවාගේ භාෂා වර්ධනයට වඩාත් උපකාරී වන්නේ මින් කුමක් ද?
(1) දරුවාගේ සුරතල් බස් අනුකරණය කිරීම (2) ශබ්ද නගන ක්‍රීඩා භාණ්ඩ ලබා දීම
(3) නැළවිලි ගී ගායනා කිරීම (4) පරිසරයේ ශබ්දවලට යොමු කිරීම


**25.** පළමුවසර තුළ දරුවාගේ චාලක හැකියා දියුණු කිරීමට වඩාත් සුදුසු ක්‍රීඩා භාණ්ඩ දෙකකි,
(1) මෘදු මොළොක් ක්‍රීඩා භාණ්ඩ සහ සුළං පිරවූ බෝල.
(2) බෝනික්කන් සහ කැලි ගලවා සවි කරන රූප.
(3) බෝනික්කන් සහ ශබ්ද නගන සතුන්.
(4) කැලි ගලවා සවිකරන රූප සහ සුළං පිරවූ බෝල.

**26.** පළමුවසර තුළ දරුවා පිළිබිඹු කරන භාවිකවල ලක්ෂණයක් **නොවනුයේ**,
(1) ක්ෂණික බව. (2) තීව්‍ර බව. (3) ස්ථාවර බව. (4) නිතර පෙන්වන බව.

**27.** යොවුන් දරුවන් තුළ දැකිය හැකි අසාමාන්‍ය චර්යාවකි,
(1) දවල් සිහින මැවීම. (2) හීනමානයෙන් පෙළීම. (3) වීරාභිවන්දනය. (4) අනුකරණය.

**28.** විනිවිද පෙනෙන රෙද්දක් මත නොපිටින් හුරුඑකටු මැස්ම මැසීම හඳුන්වනුයේ,
(1) ක්විල්ට් කිරීම ලෙස ය. (2) ෂේයා (සෙවනැලි) වැඩ ලෙස ය.
(3) එම්බොස් කිරීම ලෙස ය. (4) ආරෝපනය කිරීම ලෙස ය.

**29.**



A B

ඉහත A සහ B යන රූපසටහන්වලින් දැක්වෙනුයේ පිළිවෙළින්,
(1) ලේසි ඩේසි මැස්ම සහ සැටින් මැස්ම ය. (2) දම්වැල් මැස්ම සහ නැටි මැස්ම ය.
(3) නැටි මැස්ම සහ ලේසි ඩේසි මැස්ම ය. (4) දම්වැල් මැස්ම සහ සැටින් මැස්ම ය.

**30.** පහත දැක්වෙනුයේ මූට්ටුවක් මැසීමේ ක්‍රියාවලියකි.
- රෙදි දෙපොට මූට්ටු කිරීම
- මූට්ටුවෙහි එක් පොටකින් අඩක් කැපීම
- අනෙක් පොට ඒමත නවා වාටි මැසීම

මෙම මූට්ටුව වනුයේ,
(1) ප්‍රංශ මූට්ටුව ය. (2) අතිච්ඡාදන මූට්ටුව ය. (3) සරල මූට්ටුව ය. (4) පැතලි මූට්ටුව ය.

**31.** සිහින් නූල් දුවවීමේ දී **නොකළයුතු** වන්නේ මින් කුමක් ද?
(1) ගැටයක් යොදා ආරම්භ කිරීම (2) සමාන දිගින් යුත් මැස්ම යෙදීම
(3) දකුණු පස සිට වම්පස දක්වා මැසීම (4) පිස්මේන්තු තුනක් මසා අවසාන කිරීම

**32.** කුෂන් කවරයක් මසා නිම කිරීම හා සම්බන්ධ නිවැරදි කරුණ මින් කුමක් ද?
(1) විවරයෙහි දෙපස වාසි සමානව තැබීම
(2) පෝරුවක් යෙදීම අත්‍යවශ්‍ය වීම
(3) සරල මැහුම් ක්‍රම සහ මැසීමේ ශිල්පීය ක්‍රම භාවිත කිරීම
(4) අක්සැරසිලි ලෙස මතුපිට සීක්වීන්ස් ඇල්ලීම

**33.** ටෙරිලින්,
(1) කෘත්‍රිම පොලිමයිඩ කෙන්දකි. (2) අර්ධ කෘත්‍රිම කෙන්දකි.
(3) ඇක්‍රිලික් කෙන්දකි. (4) කෘත්‍රිම පොලිඑස්ටර් කෙන්දකි.

[හතරවැනි පිටුව බලන්න.

Agaram.lk - Keep your dreams alive !
Agaram.lk - Keep your dreams alive !
agaram.lk

www.agaram.lk



48927

**34.** ළමා ගවුමක පතරොම නිර්මාණය කිරීම සඳහා සිසුන් විසින් ලබාගත් මිනුම් අතරින් නිවැරදි මිනුම මින් කුමක් ද?
(1) කරගැඹුරේ සිට සෙ.මී. 7ක් පහළින් ඉදිරිපස දෙවන හරස් මිනුම
(2) කරගැඹුරේ සිට සෙ.මී. 4ක් පහළින් පිටුපස දෙවන හරස් මිනුම
(3) කරගැඹුරේ සිට සෙ.මී. 7ක් පහළින් පිටුපස දෙවන හරස් මිනුම
(4) කරගැඹුරේ සිට සෙ.මී. 2ක් පහළින් ඉදිරිපස දෙවන හරස් මිනුම

**35.** ළමා ගවුමක් මැසීමේ දී සිසුන් විසින් අනුගමනය කරන ලද පියවර කිහිපයක් පහත දැක්වේ. මින් නිවැරදි පියවර කුමක් ද?
(1) අත අග මැසීමෙන් පසු අතයට මූට්ටු කිරීම
(2) සායෙහි අංශ මූට්ටු මසා ඉන රැළි කිරීම
(3) අංශ මූට්ටුව සඳහා විවෘත පැතලි මූට්ටුව යෙදීම
(4) පිටුපස විවරය පියවීම සඳහා හාක්ක සහ මුදු ඇල්ලීම

**36.** න්‍යෂ්ටික පවුලක,
(1) ත්‍යාගශීලි බව වැඩි ය.
(2) පෞද්ගලිකත්වය වැඩි ය.
(3) පරාර්ථකාමී බව වැඩි ය.
(4) ආරක්ෂිත බව වැඩි ය.

**37.** නිවෙස් නිර්මාණයේ දී ජනේල සඳහා තැබිය යුතු වනුයේ කාමරවල වර්ග ප්‍රමාණයෙන්,
(1) 1/4 කි. (2) 1/6 කි. (3) 1/7 කි. (4) 1/15 කි.

**38.** විකර්ණාකාර රේඛා මගින් නිර්මාණයක පෙන්නුම් කරන ලක්ෂණයකි
(1) දැඩිබව. (2) රිද්මයානුකූල බව. (3) නිශ්චල බව. (4) ක්‍රියාශීලි බව.

**39.** උදාසීන වර්ණ,
(1) ඕනෑම වර්ණයක අගය වැඩි කරයි.
(2) කාමරයක් විශාල කර පෙන්වයි.
(3) වර්ණ ගැළපුම්වල දී භාවිත කළ හැකි ය.
(4) සුදු, කළු, රෝස සහ දම් වේ.

**40.** ගෘහීය අයවැය ලේඛනය හා සම්බන්ධ නිවැරදි වැකිය වනුයේ මින් කුමක් ද?
(1) වැය ශීර්ෂ පවුලෙන් පවුලට වෙනස් වේ.
(2) විනෝදය සඳහා වැය ශීර්ෂය අත්‍යවශ්‍ය වියදම් යටතට ගැනේ.
(3) මූර්ත ආදායම ලෙස භාණ්ඩ හා සේවා සැලකිය හැකි ය.
(4) ආදායම වැඩි වන විට ඉතිරි කිරීම් සඳහා ශීර්ෂයක් වෙන් කෙරේ.

* *

[පස්වැනි පිටුව බලන්න.

Agaram.lk - Keep your dreams alive !
Agaram.lk - Keep your dreams alive !
agaram.lk

www.agaram.lk



සියලු ම හිමිකම් ඇවිරිණි ] முழுப் பதிப்புரிமையுடையது ]All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

85 | S | I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2017 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2017

ගෘහ ආර්ථික විද්‍යාව I, II
மனைப் பொருளியல் I, II
Home Economics I, II

## ගෘහ ආර්ථික විද්‍යාව II

※ **පළමුවන** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

---

**1.** පහත සඳහන් සිද්ධිය අධ්‍යයනය කර, දී ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

පෙරේරා මහතාගේ පවුලේ සාමාජිකයින් තිදෙනෙකි. මුල් ළමාවියෙහි පසුවන දියණියක් මෙම පවුලෙහි සිටින අතර, ඔහුගේ බිරිඳ ගර්භිණී අවධියේ පසුවන්නී ය. පෙරේරා මහතා පරිරක්ෂිත ආහාර සකස් කිරීමේ ව්‍යාපාරයක් නිවසේ පවත්වාගෙන යයි. එම පවුල සීමිත ඉඩකඩ සහිත නිවසක ජීවත් වෙයි. බිරිඳ සැමියාගේ ව්‍යාපාරයට සහාය වන අතර, පවුලේ අවශ්‍යතා පිළිබඳව ද වෙහෙසෙන්නී ය. මෙම පවුල මනා සෞඛ්‍ය තත්ත්වයකින් පසුවේ.

(i) මෙම පවුල සඳහා දෛනික ආහාරවේල් සැලසුම් කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු **හතරක්** සඳහන් කරන්න.
(ii) මුල් ළමාවියේ දියණිය සඳහා ආහාරවේල් සකස් කිරීමේ දී හා පිළිගැන්වීමේ දී අනුගමනය කළ යුතු කරුණු **හතරක්** සඳහන් කරන්න.
(iii) ආහාර පරිරක්ෂණය වැදගත් වීමට හේතුවන කරුණු **දෙකක්** ලියන්න.
(iv) පරිරක්ෂණය කළ ආහාරවල ගුණාත්මක ලක්ෂණ රැක ගැනීම සඳහා ඇසුරුම් කිරීමේ දී අනුගමනය කළ යුතු කරුණු **දෙකක්** ඉදිරිපත් කරන්න.
(v) දියණිය සඳහා ඇඳුම් මෝස්තර නිර්මාණය කිරීමේ දී අනුගමනය කළ යුතු කරුණු **දෙකක්** ලියන්න.
(vi) බිහි වීමට සිටින ළදරුවාට ඇඳුම් නිර්මාණය කිරීම සඳහා රෙදි තෝරා ගැනීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු **දෙකක්** සඳහන් කරන්න.
(vii) මෙම පවුල සතු මානව සම්පත් සඳහන් කරන්න.
(viii) මෙම නිවසෙහි තැබිය හැකි ඉඩකඩ පිරිමසින ගෘහභාණ්ඩ **හතරක්** නම් කරන්න.
(ix) ගර්භිණී මව විසින් අනුගමනය කළ යුතු සෞඛ්‍ය පිළිවෙත් **හතරක්** ලියන්න.
(x) ගර්භිණී මවගේ මනා පෝෂණ තත්ත්වය සඳහා පූර්ව ප්‍රසව සායනයෙන් සැපයෙන ද්‍රව්‍ය **දෙකක්** නම් කරන්න.

**2.** ඇඳුම් මැසීමට පෙර සමහර රෙදි පිරියම් කළ යුතු වේ.

(i) (a) රෙදි පිරියම් කිරීම යනුවෙන් කුමක් අදහස් වේ ද?
(b) පිරියම් කිරීමේ ක්‍රම **දෙකක්** පැහැදිලි කරන්න.

(ii) පහත දැක්වෙන්නේ මුල් ළමාවියේ දරුවෙකුට ගවුමක් මැසීම සඳහා ලබාගත් මිනුම් කිහිපයකි.
- පපුව වටා - සෙ.මී. 60
- ඉන වටා - සෙ.මී. 55
- උරහිස සිට ඉන දක්වා උස - සෙ.මී. 27

මෙම මිනුම් භාවිත කර ළමා ගවුම් පතරොම නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය පහත සඳහන් මිනුම් ගණනය කර දක්වන්න.
(a) පපුව ඉදිරිපස මිනුම
(b) ඉන පිටුපස මිනුම
(c) අත්කට මිනුම

(iii) නූල් ඇදීම සහ වාටි මැස්ම, ඇඳුම් මැසීමේ දී භාවිත කරන මූලික මැහුම් ක්‍රම දෙකකි.
මෙම මැහුම් ක්‍රම දෙක මසා නිම කරන අයුරු පැහැදිලි කරන්න.

[හයවැනි පිටුව බලන්න.

Agaram.lk - Keep your dreams alive !
Agaram.lk - Keep your dreams alive !
agaram.lk

www.agaram.lk



**3.** (i) හඳුන්වන්න.

(a) මූලස්ථ පරිවෘත්තික වේගය (BMR)

(b) ශරීර ස්කන්ධ දර්ශකය (BMI)

(ii) මහලු අවධියේ පසුවන්නකු සඳහා සුදුසු රාත්‍රී ආහාර වේලක බොජුන්පතක් සැලසුම් කරන්න. එහි ඇතුළත් එකිනෙක ආහාර තෝරා ගැනීමට හේතු දක්වන්න.

(iii) නිවසට පැමිණි අමුත්තන් දසදෙනෙකුට රාත්‍රී ආහාර වේලක් සඳහා මේසය සකස් කරන අයුරු දළ රූපසටහනක් මගින් ඉදිරිපත් කරන්න.

**4.** (i) පිළියෙල කළ ආහාරවල ගුණාත්මක ලක්ෂණ ආරක්ෂා වීම සඳහා අලෙවි කරන්නෙකු විසින් අනුගමනය කළ යුතු පිළිවෙත් **තුනක්** සඳහන් කරන්න.

(ii) (a) තාප සංක්‍රාමණ ක්‍රම නම් කරන්න.

(b) ආහාර වර්ගයක් නම් කර, එය පිසීම සඳහා අදාළ ප්‍රධාන තාප සංක්‍රාමණ ක්‍රමය පැහැදිලි කරන්න.

(iii) (a) මාළු ඇඹුල්තියල් සෑදීමේ දී යොදන පරිරක්ෂණ කාරක සඳහන් කරන්න.

(b) මාළු ඇඹුල්තියල් සෑදීමේ ක්‍රියාවලිය පියවර ඇසුරෙන් ලියන්න.

**5.** (i) ගෘහ සැලසුම් මූලධර්මයක් වන 'රාශීකරණය' හඳුන්වන්න.

(ii) 'තුලනය' මෝස්තර මූලධර්මයකි. කාමරයක් තුළ විධිමත් තුලනය ඉදිරිපත් කළ හැකි අයුරු රූපසටහනක් මගින් දක්වන්න.

(iii) ඒකවර්ණ ගැළපුමක් යොදා ගනිමින් විසිත්ත කාමරයක් අලංකාර කරන අයුරු පැහැදිලි කරන්න.

**6.** (i) ස්ත්‍රී ලිංගික හෝර්මෝන නම් කර, ඒවායේ කෘත්‍ය සඳහන් කරන්න.

(ii) පූර්ව ප්‍රසව සංවර්ධන අවධි තුන පැහැදිලි කරන්න.

(iii) උදෑසන ඔක්කාරය සහ වමනය ගර්භිණී අවධියේ දී දක්නට ලැබෙන ලක්ෂණයකි. මෙයට හේතු දක්වා, මෙම තත්ත්වය අවම කර ගැනීමට ගත හැකි පියවර සඳහන් කරන්න.

**7.** (i) ආරය හා පරිසරය දරුවන්ගේ සංවර්ධනය කෙරෙහි බලපාන සාධක දෙකකි.

(a) ආරය

(b) පරිසරය

හඳුන්වන්න.

(ii) යොවුන්වියෙහි දරුවන්ගේ කායික වර්ධනය පිළිබිඹු කරන ලක්ෂණ **හතරක්** පැහැදිලි කරන්න.

(iii) 'සමාජයට යොමු වීමට යෞවනයා කැමැත්තක් පෙන්වයි.' උදාහරණ දෙමින් සාකච්ඡා කරන්න.

* * *

Agaram.lk - Keep your dreams alive !

Agaram.lk - Keep your dreams alive !

agaram.lk